සියළුම හිමිකම් ඇවිරිණි]
*All Rights Reserved ]*

**පාසල් වලට සිසුන් තොරා ගැනීමට සහ ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම සඳහා පැවැත්වෙන විභාගය**

**II පත්‍රය**

**නැණ ලොවට පා නගන හපනුන්ට මඟ කියන**

# 6

# "අදිති"

පැය 01 යි මිනි 15

විභාග අංකය ..............................

**විභාගයට පෙනී සිටින ඔබ සඳහා උපදෙස්**

- ඔබේ විභාග අංකය ඉහත කොටුව තුළ ඇති තිත් ඉර මත ලියන්න.
- තුන්වැනි පිටුවේ ඇති නියමිත ස්ථානයේද ඔබේ විභාග අංකය ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 60 ක් ඇත ප්‍රශ්න සියල්ලටම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේම ලියන්න.
- පිළිතුරු 3 ක් දී ඇති ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න පිළිතුරු ලියන්නට ඇති ප්‍රශ්නවල පිළිතුරු තිත් ඉර මත ලියන්න.
- කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ

| පිටු අංකය | ලැබූ ලකුණු |
|---|---|
| 1 | |
| 2 | |
| 3 | |
| 4 | |
| 5 | |
| 6 | |
| 7 | |
| 8 | |
| එකතුව | |
| අවසාන ලකුණ | |
| ඉලක්කමෙන් | |
| අකුරෙන් | |

| | කෙටි අත්සන හා සංකේත අංකය |
|---|---|
| **පළමු පරීක්ෂක**<br>ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍රය ඇගයීම් කළ බව සහතික කරමි. | V/I/S |
| **දෙවන පරීක්ෂක**<br>පළමු පරීක්ෂක කර ඇති ඇගයීම් නිවැරදි බව සහතික කරමි. | V/I/S |
| **ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක**<br>ඇගයීම් කර ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණ නිවැරදි බව තහවුරු කරමි. | V/I/S/EMF |
| **ප්‍රධාන පරීක්ෂක**<br>අධීක්ෂණය කළෙමි.<br>අවසාන ලකුණ නිවැරදිය. | V/I/S/CH |

- **පහත ඡේදය හොඳින් කියවන්න.**

මේ මිහිතලයේ සෑම බිම් අඟලක් ම මගේ පරපුරට ශුද්ධ වූ වස්තුවකි. දිලිසෙන දේවදාර ගසක සෑම කිනිත්තක් ම වැලිතලාවලින් පිරී ගිය සෑම වෙරළක් ම අඳුරු වනාන්තරවල තිබෙන සෑම මිහිදුම් වලාවක් ම, සිහින් හඬින් ගී ගයන සෑම කුඩා ප්‍රාණියෙක් ම මගේ මිනිසුන්ගේ මතකයේ හා අත්දැකීම් සමුදායේ පූජනීය වූ වස්තු හු වන්නෝ ය. ගස් අතුරින් විහිදී යන සෑම අඩි පාරක් ම මිනිසා පිළිබඳ ස්මරණය රැගෙන යන්නේ ය. අප මිහිතලයේ කොටසක් වන අතර ම මිහිතලය ද අපගේ ම කොටසකි. ''සියැටල්'' තවදුරටත් ප්‍රකාශ කරයි.

**01. ඡේදය ඇසුරින් ම පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

i. මගේ පරපුරේ ශුද්ධ වූ වස්තු ලෙස දක්වා ඇත්තේ කුමක් ද?

..............................................................................................................................

ii. මෙහි සඳහන් පූජනීය වස්තු දෙකක් ලියන්න.

..............................................................................................................................

..............................................................................................................................

iii. ඡේදයේ සඳහන් ප්‍රාණවාචී බහුවචන ආඛ්‍යාත පදයක් ලියන්න.

..............................................................................................................................

iv. මෙම ප්‍රකාශය කර ඇත්තේ කවරෙක් ද?

..............................................................................................................................

v. මේවා සමානපද ඡේදයෙන් සොයා ලියන්න

පරම්පරාවට - .................................................. පැතිරී - ..................................................

vi. ඡේදයේ සඳහන් මහප්‍රාණ අක්ෂරයක් සහිත වචනයක් සොයා ලියන්න.

..............................................................................................................................

vii ඡේදයේ සඳහන් සඤ්ඤක අක්ෂරයක් සොයා ලියන්න.

.............................................................................................................. (ල 07)

**02. දී ඇති වචන ගලපා අර්ථවත් වාක්‍යයක් සාදන්න.**

i. පොතේ / කියවද්දී / පොත් / මැවෙනවා / තියෙන / හිතේ / දේවල් (ල 01)

..............................................................................................................................

**03. නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත වචනය තෝරා හිස්තැනෙහි ලියන්න.**

i. ............................ (පෘතුවියේ / පෘථිවියේ ) ඡායාව අපේ මධ්‍යස්ථානයට වැටීම නිසා වායු පිරිසිදු කරන ............................ (උපකරනය / උපකරණය ) ක්‍රියාත්මක වී නැහැ.

ii. ............................ (වේලුණු / වේළුණු ) කොහු නෙළීමෙන් ඇ හදා ගත්තේ මිදුල මැද රන්වන් කොහු ............................ ( වළාකුළක් / වලාකුළක් ) (ල 02)

**04. පහත සඳහන් යෙදුම් සඳහා ගැළපෙන ප්‍රස්ථාව පිරුළ ලියන්න.** (ල 02)

i. දුර දිග නොබලා වැරදී තීන්දුවක් ගැනීම.

..............................................................................................................................

ii. අනුන් රවටන්න ගොස් තමන් රැවටීම

..............................................................................................................................

**05. සුදුසු විරාම ලකුණු යොදන්න.** (ල 02)

i. ඔක්සිජන් ටිකක් දීලා බලමු යි කවුදෝ කීවා

.................................................................................................................................................

ii. සීයේ සීයේ අදත් කතන්දරයක් කියන්නකෝ  නංගි ඇයද සිටියා ය

.................................................................................................................................................

**06. පහත යුගල පද සම්පූර්ණ කරන්න.** (ල 02)

i. අහල - ............................................ ii. ............................................ - බිමන්

**07. පහත කවිය සම්පූර්ණ කරන්න.** (ල 01)

..................................................................................
මුළු මිදුල මැ සුවඳයි - අපේ මේ
මුළු මිදුල මැ සුවඳයි

**08. පහත පදවල අනුක්ත නාමපද ලියන්න.** (ල 02)

i. ගොවියෙක් - ............................................ ii. වෛද්‍යවරු - ..................................

09. පහත දක්වා ඇත්තේ පෞද්ගලික ලිපියක ආකෘතියකි




(ල 02)

i. මෙහි අංක 02 යොදා ඇති ස්ථානයේ ලිවිය යුත්තේ කුමක් ද?

....................................................................................................................................................

ii. මෙහි අංක 03 යොදා ඇති ස්ථානයේ විරාම ලකුණු කුමක් ද? ......................................................

10. පහත දැක්වෙන හිස් කොටු සඳහා සිංහල අක්ෂරමාලාව අනුව නිවැරදි අකුර තෝරා ලියන්න.

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| **i** | ත | ථ | ද | ධ | | (ණ, න, ප) |
| **ii** | ශ | ෂ | ස | හ | | (ෆ , ළ, ල) |

(ල 02)

11. හිස්තැනට සුදුසු ක්‍රියාපදය තෝරා ලියන්න.

i. සමහරු කුඩ ඉහලාගෙන ........................................... ( යයි / යති)

ii. මල් වැහි .................................. ( වසියි / වසිති ) (ල 02)

12. පහත වාක්‍යවල උපමාව යටින් ඉරක් අඳින්න.

i. රාත්‍රියේ පියාඹන කණාමැදිරියන් අහසේ දිදුලන තරු මෙන් පෙනුණි.

ii. රළය බිඳ වැටීමෙන් ගලන වතුරෙන් කොටසක්, තීන්ත පොවන කඩදාසියක් තීන්ත උරා ගන්නාක් මෙන් , බුරුල් පස් අතරින් පොළොව උරා ගනියි. (ල 02)

13. පහත සඳහන් වාක්‍ය බහුවචනයට හරවා ලියන්න.

i. කුරුල්ලා පියාඹාගෙන කූඩුවට අවේ ය. (ල 01)

..........................................................................................................................................

14. පහත රූපවලට ගැළපෙන දෙමළ වචනය සිංහල අකුරෙන් ලියන්න.

 ................................................  ................................................

(ල 02)

15. පහත දෙමළ වාක්‍යයේ සිංහල තේරුම ලියන්න.

i. එන්දු ඉඩියප්පම් තාරුංගළ් - ..........................................................................................

- පහත වගන්තිය දෙමළ බසින් සිංහල අකුරෙන් ලියන්න.

ii. සුබ නත්තලක් වේවා! - .................................................................................... (ල 2)

16. හිස්තැනට සුදුසු වචනය තෝරා යටින් ඉරක් අඳින්න.

i. What colour .................................. (is / aer ) this ?

ii. Where ............................ ( do / does ) you live ? (ල 02)

17. පහත එක් එක් රූපයට ගැළපෙන ඉංග්‍රීසි වචනය ඉංග්‍රීසි අකුරෙන් ලියන්න.

i.  ii. 

.......................................... .......................................... (ල 02)

18. පහත දී ඇති වචන නිවැරදිව ගලපා අර්ථවත් වැකියක් බැගින් ලියන්න.

i. small / is / That / a / tree

..........................................................................................................................................

ii. pencil / It / my / is / box

.................................................................................................................................... (ල 02)

19. "තිස් හය දහස් අනූව" ට දෙකක් අඩු සංඛ්‍යාව අකුරෙන් ලියන්න.

.....................................................................................................................................

20. රූපයේ දැක්වෙන ලී පටියේ දිග කීය ද?




.........................................................................cm

21. මා ළඟ ඇති මුදලට වඩා රු. 2785.00 ක් නංගී ළඟ ඇත. නංගී ළඟ ඇති මුදල රු. 4725.00 ක් නම් මා ළඟ ඇති මුදල කීය ද? .....................................................................................................

22.  

2 kg 50 g 1 kg 95 g

වට්ටක්කා ගෙඩි දෙකේ බර කොපමණ ද? .......................................kg ............... g

23. මෙම සංඛ්‍යා ආරෝහන පිළිවෙළට ලියන්න.

$\frac{3}{5}$ , $\frac{1}{2}$ , 0.4 , 0. 75 .....................................................................................................

24. ප.ව. 1.30 ට පාසල ඇරී ගෙදර ඒමට පිටත් වූ සමගි පැය 2 මින්ත්තු 20 ක ගමනකින් පසු නිවසට පැමිණියේ ය. ඇය නිවසට පැමිණි වේලාව පැය විසිහතරේ ඔරලෝසු වේලාවෙන් ලියන්න.....................................................................................................................................

25. කම්කරුවෙකුට පැයකට රු. 90 බැගින් ගෙවීමක් කරනු ලබයි. එක් කම්කරුවෙක් දිනකට පැය 6 ක් වැඩ කරයි. කම්කරුවන් සිව් දෙනෙකු සඳහා දිනකට ගෙවිය යුතු මුදල කීය ද?

.....................................................................................................................................

26. 

මෙම රූපය තුළ සෘජුකෝණයට වඩා විශාල කෝණ කොපමණ තිබේ ද?

.....................................................................................................

27. එක් පේළියක ගැහැනු ළමුන් සහ පිරිමි ළමුන් මාරුවෙන් මාරුවට සිටිති. පේළියේ මුලින් ම සිටියේ පිරිමි ළමයෙකි. පේළියේ සිටි මුළු ළමුන් ගණන 21 කි. එහි සිටි පිරිමි ළමුන් ගණන කීය ද? .....................................................................................................................

28. පෙ.ව. 10.00 ට පිටත් වීමට නියමිත බස් රථයක් ගමන පටන් ගත්තේ මිනිත්තු 20 කට පසුව ය. ගමනට ගත වූ කාලය පැය 4 මිනිත්තු 45 කි. එය ගමනාන්තයට ලඟා වූ වේලාව කීය ද?

.................................................................................................................................................

29. මීටර් 4 ක් දිග, මීටර් 4 ක් උස බිත්තියක තීන්ත ගෑමට තීන්ත තීන්ත ලීටර් දෙකක් අවශ්‍ය වේ. මීටර් 8 ක් දිග , මීටර් 1 ක් උස එවැනි ම බිත්තියක ගෑමට තීන්ත කොපමණ අවශ්‍ය ද?................

30. මාතර සිට ගාල්ල , කොළඹ හරහා මහනුවරට ඇති දුර 277 km නම්, ගාල්ලේ සිට කොළඹ හරහා මහනුවරට ඇති දුර කොපමණ ද? ..............................




31. 

i. මෙම රූපයේ ඇති සෘජුකෝණ ගණන කීය ද?

.................................................................................................

ii. මෙම රූපය සමමිතිකව බෙදෙන රේඛාව අඳින්න.

32. පහත දැක්වෙන මිල දර්ශනය ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

| ද්‍රව්‍ය | මිල |
|---|---|
| හාල් 1 kg | රු. 220.00 |
| කරවල 1 kg | රු. 900.00 |
| පරිප්පු 1kg | රු. 320.00 |

i. අම්මා කඩයට ගොස් හාල් 2 kg ද , කරවල 500 g ද , පරිප්පු 250g ද මිලදී ගත් පසු ගෙවිය යුතු මුදල කීය ද? ..............................

ii. අම්මා කඩයට යනවිට ගෙන ගියේ රු. 1000.00 කි. බඩු ගත් පසු ඇයට ඉතුරුවන මුදල කොපමණ ද?..................................................

(ලකුණු 30)

33. මුල් මගින් ජලය උරා ගන්නා බව පෙන්වීම සඳහා යොදාගත හැකි ශාකයකි,

i. කංකුං ii. නිවිති iii. කුඩලු

34. සමනලයාගේ ජීවන චක්‍රයේ තුන්වන අවස්ථාව වන්නේ,

i. දළඹුවා ii. බිත්තර iii. කෝෂය

35. රූපයේ දැක්වෙන උපකරණය වන්නේ,



i. නගුල ii. වියගහ iii. පෝරුව

36. සිතියමේ අඳුරු කර ඇති පළාත නම් කරන්න.



i. දකුණු පළාත ii. වයඹ පළාත iii. උතුරු පළාත

37. මෙම රූපයෙන් දැක්වෙන්නේ කවරෙක් ද?



i. සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය

ii. සිබිල් මෙත්තසිංහ මහත්මිය

iii. ඇහැලේපොළ කුමාරිහාමි

38. සූර්යග්‍රහණය සහ චන්ද්‍රග්‍රහණය සිදුවිය හැකි දින පිළිවෙලින් දැක්වෙන පිළිතුර වන්නේ

i. අව අටවක පොහෝදින සහ පුර අටවක පොහෝදින

ii. පසළොස්වක පොහෝදින සහ අමාවක පොහෝදින

ii. අමාවක පොහෝදින සහ පසළොස්වක පොහෝදින

39. පසළොස්වක පොහොය උදා වන්නේ පුර අටවක පොහෝදිනයට දින කීයකට පසු ද?

i. දින පහළොවකට පසු ii. දින හතකට පසු iii. දින අටකට පසු

40. | S N | | S N |

මෙම කාන්දම් දෙක ළං කළ විට සිදු විය හැක්කේ කුමක් ද?

i. ආකර්ෂණය ii. විකර්ෂණය iii. එකට ඇලීම

41. මේදය බහුල ආහාරයකි,

i. ගස්ලබු ii. නිවිති iii. රටකජු



42. මෙම ක්‍රියාකාරකම මගින් අපට හඳුනාගත හැක්කේ,

i. විවිධ චුම්බක හැඩ ඇති බවයි. ii. චුම්බකවල විකර්ෂණ ගුණයයි

iii. චුම්බකවල ආකර්ෂණ ගුණයයි

43. ක්ෂීරපායි සතුන්ගේ ලක්ෂණයකි

i. සර්ව භක්ෂක වීම ii. මව් කිරිවලින් පැටව් පෝෂණය වීම

iii. ගොඩබිම් පමණක් වාසය කිරීම

44. තෙල් සහිත ආහාර බහුලව ගැනීමෙන් ඇතිවිය හැකි රෝගී තත්ත්වයකි,

i. මුඛ පිළිකා ii. දියවැඩියාව iii. හෘදයාබාධ

45. ජාතික කොඩිය ඔසවන අවස්ථාවක් නොවන්නේ,

i. පාසලේ උදය රැස්වීම ii. නිදහස් දින උත්සවය iii. පාසල් සංවර්ධන රැස්වීම

46. සාමූහික ක්‍රීඩාවලදී තටයුතු නොකළ යුතු ආකාරයක් වන්නේ,

i. තමා සැමවිට ම නායකත්වය ඉසලීම ii. තම කාර්යය වගකීමෙන් ඉටු කිරිම

iii. ජය පරාජය සම සිතින් පිළි ගැනීම

47. කුඹුරුවලට පැමිණෙන සතුන් එළවීම සඳහා අතීතයේ ගොවියන් භාවිත කළ උපකරණය වන්නේ,

i. වක්කඩ ii. බෝල් අත්ත iii. දිය හොල්මන

48. ජලය ඇසුරු කර ගනිමින් ද්‍රවිඩ ජනයා සිදු කරනු ලබන සංස්කෘතික කටයුත්තක් වන්නේ,

i. ප්‍රසාද ස්නාපනය ii. කුම්භාභිෂේකය iii. ළිඳ හා ගනුදෙනු කිරිම

49. මහා පරාක්‍රමබාහු රජතුමා තම රාජධානිය ලෙස තෝරා ගන්නේ කොහේ ද?

i. අනුරාධපුර ii. පොළොන්නරුව iii. යාපහුව

50. ශ්‍රී ලංකාවේ ඒක දේශික ක්ෂීරපායි සත්ත්වයෙකි.

i. කැහිබෙල්ලා ii. ගල්පාඩියා iii. කලවැද්දා

51. මෙම උපකරණයෙන් සිදු කරන කාර්යය වන්නේ,

i. ඇණ ගැසීමට භාවිතා කිරිම ii. නියනට තට්ටු කිරීමට යොදා ගනී



iii. කොස් ඇට තැලීමට යොදා ගනි

52. විසිතුරු මැහුම් ක්‍රමයකි.

i. හුරුළු කටු මැස්ම ii. වාටි මැස්ම iii. මෝවිට මැස්ම

53. අයඩීන් ඌනතාවය ඇති වූ විට සෑදෙන රෝගයකි.

i. රක්තහීනතාවය ii. ගලගණ්ඩය iii. කොලරාව

54. ඇස් හරවා බැලිය නොහැකි වන්නේ,

i. පක්ෂීන්ට ii. කෘමීන්ට iii. සිව්පාවන්ට

55. පොළොවෙන් විශාල කොටසක් වැසී ඇත්තේ කුමකින් ද?

i. වනාන්තරවලින් ii. ජලයෙන් iii. වැලි සහිත කාන්තාර වලින්

56. උපකරණ නිසි තැන නොතැබීමෙන් සිදුවන හානියකි,

i. කාලය අපතේ යාම ii. වැඩ පහසු වීම iii. සාර්ථක ප්‍රතිඵල ලැබීම

57. කාන්දමකට ඇද නොගන්නා දෙයක් වන්නේ,

i. අල්පෙනෙති ii. ඇමුණුම් කටු iii. තඹ කාසිය

58. අලුගිරවා පක්ෂියා දැකිය හැකි මුදල් නෝට්ටුව වන්නේ,

i. රු. 100 ii. රු. 500 iii. රු. 1000

59.  මෙම උපකරණය හඳුන්වන නම කුමක් ද?

i. බුම්මැඩිය ii. සෙක්කුව iii. ඉලත්තට්ටුව (ලකුණු 27)

60. සුපුරුදු පරිදි මම අම්මා සමඟ අම්මාගේ යතුරුපැදියේ නැගී පාසල් යාමට පිටත් වුණෙමි. ටික දුරක් යනවිට කුඩුවකින් බිමට වැටුණු කුරුලු පැටියකු මගේ නෙත ගැටුණි. මම වහා අම්මාට යතුරු පැදිය නවතන ලෙස කීවෙමි. මෙම සිද්දියට මුහුණ දුන්නේ ඔබ යැයි සිතා මින් ඉදිරියට සිදුවූ දේ පිළිබඳව නිවැරදි නිර්මාණාත්මක වගන්ති 03ක් ලියන්න. සෑම වගන්තියක ම වචන 05ක් හෝ ඊට වැඩිවිය යුතු ය. උක්ත ආඛ්‍යාත හා අක්ෂර වින්‍යාසය නිවැරදි විය යුතු ය.

(ලකුණු 06)

i. ..........................................................................................

..........................................................................................

ii. ..........................................................................................

..........................................................................................

iii. ..........................................................................................

..........................................................................................

(පැහැදිලි අත් අකුරු සහ සමස්ථ පිළිතුරු පත්‍රයේ පිරිසිදුව බව සඳහා ලකුණු 01 ක් ප්‍රධානය කෙරේ)